දරුවන් උදෙසා
බයිබලයක්



# නෙහෙමියා සහ මහා පවුර

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

බලවත් ජාතියක් වූ පර්සියාව ලෝකය පාලනය කළේය.
තවද අර්තක්ෂස්තා රජු පර්සියාව පාලනය කළේය.
එමගින් ඔහු ලොව බලවත්ම පාලකයා බවට පත් විය.
රජුට ප්‍රයෝජනවත් කෙනෙකු වූයේ නෙහෙමියා
නම් යුදෙව් ජාතිකයෙකි.
ඔහුගේ කාර්ය වූයේ රජුට
ඇති විය හැකි විෂ වලින්
ආරක්ෂා කිරීම සඳහා
රජුගේ ආහාර
රස බැලීමයි.



දිනක් නෙහෙමියා ඉතා දුක්මුසු මුහුණින් යුතුව රජු ඉදිරියට පැමිණියේය. රජුට සිදුවී ඇති දේ දැනගැනීමට වුවමනා විය. “රජතුමනි, ඔබ සදහටම ජීවත් වේවා” නෙහෙමියා පැවසීය. “මගේ පියවරුන් මිහිදන් කර ඇති නගරය නටබුන් වී ඇති නිසාත්, එහි දොරටු ගිනි තබා ඇති නිසාත් මම කණගාටු වෙමි”යි ඔහු කීවේය. නෙහෙමියා කතා කළේ වසර ගණනාවකට පෙර යුද්ධයෙන් විනාශ වූ ජෙරුසලම ගැන ය.



අර්තක්ෂස්තා රජ, “ඔබ කැමති කුමකට දැ”යි ඇසී ය. “මට ජෙරුසලමට යන්න දෙන්න, මට එය නැවත ගොඩනගන්න පුළුවන්යැ”යි නෙහෙමියා ආයාචනා කළේය. අර්තක්ෂස්තා රජු ඊට කාරුණිකව එකඟ වූයේය. රජු, නෙහෙමියා සංචාරය කරන විට ඔහුගේ ආරක්ෂාව සඳහා නිල ලිපිද දුන්නේය.



රජු ඊටත් වඩා තවත් උපකාර කළේය. ඔහු නෙහෙමියා අත රජුගේ වනාන්තර පාලකයා වූ ආසාප්ට ලිපියක් යැව්වේය. නගරයේ පවුරු ගොඩනඟනු සඳහා නෙහෙමියා ඉල්ලන තරම් දැව ලබා දෙන ලෙස ආසාප්ට අණ ලැබුණි.



නෙහෙමියා ජෙරුසලමට පැමිණි විට, ඔහු නගර නිලධාරීන් රැස් කර, “අප සිටින්නේ විපතකය, නගරය නටබුන් වී ඇත, දොරටු ගිනිබත් වී ඇත, අපි නැවත ගොඩනැඟීමට පටන් ගනිමුයැ”යි පැවසුවේය. ඔහු ඔවුන්ට, අර්තක්ෂස්තා රජු එය අනුමත කළ බවත්, සියල්ලටම වඩා දෙවියන් වහන්සේ ඔවුන්ගේ පැත්තේ සිටින බවත් පැවසුවේය.



නෙහෙමියාගේ ඇදහිල්ල සහ උද්යෝගය මිනිසුන්ට උනන්දුවක් ඇති කළේය. ඔවුහු එකඟ වෙමින් “අපි නැවත ගොඩනගමුයැ”යි කීවෝය. නෙහෙමියා සෑම පවුලකටම බිත්තියේ කුමන කොටස සවි කළ යුතුද කියා කීවේය.



එහෙත්, පවුර නැවත ගොඩනැඟීමට සියලු දෙනාම එකඟ
වූයේ නැත. සන්බලට් නම් මිනිසෙක් සහ ඔහුගේ මිතුරන්
දෙදෙනා වන ටෝබියා සහ
ගෙෂෙම් යුදෙව්වන් නොවූ
අතර ඔවුහු පවුර නැවත
ගොඩනඟනවාට



හෝ දොරටු සවි කිරීමට
කැමති නොවූවෝය.

කාර්යය සිදුවෙමින් යද්දී සන්බැලට් බෙහෙවින් කෝප වූයේය. ඔහු සහ ඔහුගේ මිතුරෝ යුදෙව්වන්ට සමච්චල් කළෝය. ටෝබියා, “ඔවුන් එම කුඩා පවුර ගොඩනඟා අවසන් වූ විට, එක් කුඩා හිවලෙකු වුව එය කඩා වට්ටනු ඇතැ”යි කීවේය. නෙහෙමියා පිළිතුරු දුන්නේ නැත. ඒ වෙනුවට ඔහු යාච්ඤා කළේ දෙවියන් වහන්සේට ඔවුන් ගැන තීරණ ගන්නා ලෙස කියමිනි.



ඔවුන්ගේ සමච්චල් අපහාසවලින් කිසිදු බලපෑමක් සිදු නොවූ විට, ඔවුන් එක්ව ජෙරුසලමට එරෙහිව සටන් කිරීමට සහ ඔවුන්ට හැකි තරම් කරදර ඇති කිරීමට සැලසුම් කළෝය. නැවතත් නෙහෙමියා දෙවියන් වහන්සේගේ උපකාරය ඉල්ලා යාච්ඤා කළේය. ඔවුන් බලාපොරොත්තු නොවූ කරදරයක් සිදු නොවන ලෙස ඔහු දිවා රෑ මුරකරුවන්ද තැබුවේය.



ජුදෙව්වන් මහන්සි වී
වැඩ කළ අතර ඔවුන්
වෙහෙසට පත් විය.
සමහරුන්ට තමන් වැඩ
කරද්දී සතුරා පැමිණ
මරා දමාවි කියා බියක්
ඇති විය. ඒ වුණත්
නෙහෙමියා ව්‍යාපෘතිය
නතර නොකළේය. ඔහු
කම්කරුවන් වටා
මුරකරුවන් තබා
දෙවියන් වහන්සේ
ඔවුන්ගේ පැත්තේ සිටින
බවත් දෙවියන් වහන්සේ
ඕනෑම සතුරෙකුට වඩා
බලවත් බවත් ඔවුන්ට
මතක් කර දුන්නේය!



නෙහෙමියා මිනිසුන්ට
හොඳ ආදර්ශයක්
වීමට උත්සාහ කළේය.
අර්තක්ෂස්තා රජු
ඔහුව ජෙරුසලමේ

ආණ්ඩුකාරයා බවට පත්
කළේ මිනිසුන්ගෙන්
ආහාර සහ මුදල් ඉල්ලා
සිටීමට ඇති අයිතියද
ඇතිවය. නමුත් ඔහු එය
නොකළේය. පවුර නැවත
ගොඩනගද්දී ඔහු මිනිසුන්
සමඟ වෙහෙස මහන්සි වී
වැඩ කළේය. ඔහු ආහාර
මිලදී ගැනීමට තම
මුදල් යොදා
ගත්තේය.



අවසානයේදී, මිනිසුන් පවුර සාදා අවසන් කළ අතර, ප්‍රධාන ඇතුළුවීමේ දොරටුවලට දොරවල් පමණක් තැබිය යුතු විය. තවදුරටත් බිත්තිවල හිඩැසක් නැති බව සැන්බැලට්, ටෝබියා සහ ගෙෂෙම් දැනගත් විට, ඔවුහු නෙහෙමියාට හානි කිරීමට සැලසුම් කළෝය.



ඕනෝ නම් ස්ථානයකදී ඔවුන් හමුවීමට එන ලෙස ඔවුහු නෙහෙමියාට පණිවිඩ එවූහ. නමුත් නෙහෙමියා, ඔවුන් සූදානම් වන්නේ තමුන්ව නුවරින් පිටතට ගෙන්වාගෙන හානි කිරීමට බව දැන සිටියේය. වැඩ අතහැර ඔවුන් හමුවන්නේ නැති බව ඔහු ඔවුන්ට ආපසු ලියා යැවීය.



අවසානයේදී
පවුර නිම කරන
ලද අතර,



නෙහෙමියා එය
ආරක්ෂා කිරීමට
ආරක්ෂකයින් යෙදවීය.


ඉර මුදුන් වන තුරු
දොරටු විවෘත
නොකළ යුතු බවට
නියමයක් ද ඔහු
කළේය.
රාත්‍රිය
පුරා, ඒවා වසා
දැමීම හා දොර අගුලු දමා
තැබීම සිදු කළ යුතු විය.

නගරය ආරක්ෂිතවූ බැවින්, ලෝකයේ විවිධ ප්‍රදේශවලින් වහලුන් ලෙස සිටි බොහෝ ජුදෙව්වෝ ජෙරුසලමට ආපසු ගියෝය. කොයිතරම් බාධක මැද වුණත් දෙවියන් වහන්සේ තමන්ට පැවරූ වැඩය නිම කිරීම ගැන නෙහෙමියා බෙහෙවින් සතුටු වූවා විය හැක. ඔහු ජෙරුසලමේ නැවතී සිට, සෑම විටම දෙවියන් වහන්සේට කීකරු වීමට මිනිසුන්ට උපකාර කළේය.



නෙහෙමියා සහ මහා පවුර

# දේව වචනයෙන් එක් කථාවක්

# බයිබලයේ

නෙහෙමියා

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

35

60

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)